# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2009 අංක 45 දරන ලසන්ත අලගියවන්න පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 අගෝස්තු මස 31 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 සැප්තැම්බර් මස 03 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## 2009 අංක 45 දරන ලසන්ත අලගියවන්න පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2009 අගෝස්තු මස 31 වන දින]

එල්.ඩී.—ඕ. (අයි.එන්.සී.) 25/2008

**ලසන්ත අලගියවන්න පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි**

"ලසන්ත අලගියවන්න පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන පදනමක් එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව ඒ පදනමේ පරමාර්ථ හා ඊට අදාළ කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් මහර හා අත්තනගල්ලේ පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2009 අංක 45 දරන ලසන්ත අලගියවන්න පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට සහ ඉන්පසු (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) "ලසන්ත අලගියවන්න පදනමේ" දැනට සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ලසන්ත අලගියවන්න පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ, එය පාවිච්චි කිරීමේ සහ ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. පදනම සංස්ථාගත කිරීම.

3. (1) සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සිය අධ්‍යාපන කටයුතු ඵලදායී ලෙස ඉටුකර ගැනීමට පහසුවන පරිදි පාසල්වලට භෞතික හා ගුණාත්මක වශයෙන් ආධාර හා අනුබල දීම ;

2—PL 004153—2,750 (2009/07)

(ආ) ආධාර ලැබීමට සුදුසු ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා විශේෂ උපකාරක සේවා පැවැත්වීම සහ ශිෂ්‍යත්ව, පුස්තකාල පහසුකම් සහ අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය වෙනත් ආධාර ලබා දීම ;

(ඇ) රජයේ සහ අනෙකුත් විභාග සඳහා සූදානම් වීමට සිසුන්ට සහාය වීම පිණිස අධ්‍යාපනික වැඩසටහන් සහ පන්ති සංවිධානය කිරීම ;

(ඈ) අධ්‍යාපනික වැදගත්කමක් ඇති කාරණා සම්බන්ධ වැඩමුළු, සාකච්ඡා හා සම්මන්ත්‍රණ පැවැත්වීම ;

(ඉ) පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සංස්කෘතික නිපුණතා සංවර්ධනය සඳහා නිපුණතා ප්‍රදර්ශනය කිරීමට හා ඇගයීමට විධිවිධාන යෙදීම හා දක්ෂතා ඇති සිසුන් සඳහා සම්මාන සහතික ප්‍රදානය කිරීම ;

(ඊ) සාරධර්ම හා ආචාර ධර්ම අගයන සහ එකී ගුණාංග ප්‍රායෝගික ක්‍රියාවට නංවන සිසු පරපුරක් නිර්මාණය කර ගැනීමට හැකිවන පරිදි විශේෂිත වූ පුහුණු වැඩසටහන් ක්‍රියාවට නැංවීම ;

(උ) නීතිය මගින් නියම කරනු ලබන්නේ නම්, අදාළ ප්‍රාදේශීය අධ්‍යාපන අධිකාරීන්ගේ අනුමතය ඇතිව, පෙර පාසල් සහ දහම් පාසල් ගුරුවරුන් පුහුණු කිරීම සඳහා වැඩමුළු, සාකච්ඡා සම්මන්ත්‍රණ පැවැත්වීම හා පෙර පාසල් අළුතින් ආරම්භ කිරීම සඳහා දිරි දීම ;

(ඌ) පාඨශාලා ශිෂ්‍යයන් සඳහා නායකත්ව හුරුව සහ ප්‍රායෝගිකව ජීවත්වීමට, ඉගෙනුමට, පාදකවන නායකත්ව කඳවුරු හා වැඩමුළු ක්‍රියාවට නැංවීම ;

(එ) දේශාභිමානය වර්ධනය වීමට පදනම් වන සනීපාරක්ෂාව, සෞඛ්‍ය පුරුදු පිළිබඳ වැඩසටහන් හා ක්‍රීඩා හා ශාරීරික අභ්‍යාස වැඩසටහන් තුළින් සිසු පරපුරේ ශාරීරික ශක්‍යතාවය ප්‍රවර්ධනය සඳහා ප්‍රායෝගික වැඩසටහන් ක්‍රියාවට නැංවීම ;

(ඒ) ශ්‍රී ලංකාවේ උරුමය, පරිසරය සහ වනාන්තර ආරක්ෂා කිරීම අරමුණු කරගෙන අධ්‍යාපන චාරිකා, ශ්‍රමදාන සහ වැඩමුළු සංවිධානය කිරීම ;

(ඔ) ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධාන විසින් ඉටුකරනු ලබන සේවා පහසුකම් සඳහා ආධාර කිරීම හා එම සංවිධාන දිරි ගැන්වීම ;

(ඕ) අවිධිමත් අධ්‍යාපන වැඩසටහන්, විශේෂ අධ්‍යාපන වැඩසටහන් හා වැඩිහිටි අධ්‍යාපන වැඩසටහන් සඳහා පූර්ණ අනුග්‍රහය ලබා දීම හා ආධාර ලබා දීම ;

(ක) සම්ප්‍රදායික හා අපනයන කෘෂිකාර්මික කටයුතුවල නියැලෙන ගොවීන් දිරිගැන්වීම, ඔවුන් දැනුවත් කිරීම සඳහා විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම ;

(ග) රණවිරුවන්හට අවශ්‍ය පහසුකම් ප්‍රවර්ධනය සඳහා ක්‍රියාවට නැංවෙන විවිධ වැඩසටහන්වලට සහාය වීම ;

(ච) විරැකියාවෙන් පෙළෙන තරුණ ප්‍රජාව ස්වයං රැකියාවලට යොමු කිරීමට අවශ්‍ය ආධාර හා අනුබලයද, පුහුණුවද ලබා දීමට කටයුතු කිරීම ;

(ජ) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති දේශීය හා විදේශීය සංවිධාන සමග සහයෝගිව කටයුතු කිරීම ;

(ට) අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස ව්‍යාපෘති පිහිටුවීම සහ ඔවුන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් විධිවිධාන සැලැස්වීම ;

(ඩ) සියලුම ආගම්වලට අයත් ආගමික සිද්ධස්ථාන සංවර්ධනය සඳහා අවශ්‍ය විය හැකි අවස්ථාවල උපකාරවීම ;

(ණ) අවශ්‍යතා සහිත තැනැත්තන්ගේ සෞඛ්‍ය අවශ්‍යතා සහ විවිධ ශෛල්‍ය කර්ම සඳහා ආධාර ලබාදීම ;

(ත) ග්‍රාම සේවා වසම්වල පිහිටුවාගෙන තිබෙන සමිති සමාගම්වල කටයුතු සඳහා සහයෝගය ලබාදීම ; සහ

(ද) විශ්‍රාමිකයන්ගේ සුභ සාධනය වෙනුවෙන් සහාය ලබාදෙමින් කටයුතු කිරීම.

(2) මෙහි (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කොට ඇති පරිදි මේ පනතේ පරමාර්ථ ක්‍රියාවට නැංවීමේ දී ජාතිය, කුලය, ආගම, භාෂාව, ස්ත්‍රී පුරුෂ භාවය හෝ දේශපාලන මත පිළිබඳ වෙනස්කම්වලින් තොරව ඒවා ක්‍රියාත්මක කිරීමට සහතික විය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**4.** (1) සංස්ථාවේ කටයුතු මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ 6 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ රීතිවලට යටත්ව සහ එම රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන සභාපති, ලේකම්, භාණ්ඩාගාරික ඇතුළු එකොලොස් දෙනකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කුමක් සඳහන් වුව ද, පදනමේ ආරම්භක සාමාජිකයා වූ ගරු ලසන්ත අලගියවන්න මහතා අධ්‍යක්‍ෂ මණ්ඩලයේ ප්‍රථම සභාපතිවරයා විය යුතු ය.

(3) සංස්ථාවේ ප්‍රථම අධ්‍යක්‍ෂ මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුව ම වූ දිනයේදී පදනමේ පාලක මණ්ඩලයේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(4) අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සාමාජිකයකු මිය යාම හෝ ඉල්ලා අස්වීම නිසා කලින් ධුරය අත්හළහොත් මිස, ඔහුගේ තෝරා පත් වීමේ දින සිට අවුරුදු හතරක කාලයක් සඳහා ධුරය දැරිය යුතු ය.

(5) අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් සාමාජිකයකු, ඔහුගේ ධුර කාලය අවසන්වීමට පෙර තම ධුරය හිස් කළහොත්, සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත් කරගනු ලබන ඔහුගේ අනුප්‍රාප්තිකයා ධුර දැරිය යුත්තේ ඔහු විසින් අනුප්‍රාප්ත කරනු ලබන සාමාජිකයාගේ නොගෙවුනු ධුර කාලය සඳහා පමණක් වන්නේ ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**5.** නිශ්චල හෝ චංචල දේපළ අත්කර ගැනීම හෝ දැරීම, බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදානයන් සහ පරිත්‍යාග භාර ගැනීමේ සහ එකතු කිරීමේ ද සංස්ථාවේ මුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාව විසින් දරනු ලබන යම් ඉඩමක ගොඩනැගිලි හෝ ව්‍යුහයන් ඉදිකිරීම, සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීමේ, සේවයේ නියුක්ත කිරීමේ, සේවයෙන් පහ කිරීමේද බලය ඇතුළුව, සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ එහි යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කාරණා හෝ දේවල් කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාවේ යෙදවීමේ බලය මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමකදී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නො අඩු බහුතර ඡන්දයෙන්, පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, සාමාජිකයන් විසින් ගෙවිය යුතු සාමාජික ගාස්තු, ඔවුන් ඇතුළත් කර ගැනීම, අස් කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම ;

(ආ) සංස්ථාවේ සහ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ රැස්වීම් කැඳවීම හා පැවැත්වීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය, එකී රැස්වීම්වල ගණපූරණය ද ඔවුන්ගේ බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම ;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන්ගේ බලතල, කාර්යය සහ කර්තව්‍ය ;

(ඈ) සංස්ථාවේ සාමාජිකයකු වීමට හෝ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සාමාජිකයකු වීමට සපුරාලිය යුතු සුදුසුකම් ;

(ඉ) අධ්‍යක්ෂ මණ්ඩලය තෝරා පත් කර ගැනීම ; සහ

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක් (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබූ ආකාරයෙන් එවැනිම රැස්වීමකදී සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ ඒවාට යමක් එකතු කිරීම හෝ ඒවා පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැක්කේ ය.

(3) සංස්ථාවේ සාමාජිකයෝ සංස්ථාවේ රීතිවලට යටත් විය යුත්තා හ.

සංස්ථාව විසින් ගෙවිය යුතු සහ සංස්ථාවට අයවිය යුතු ණය.

7. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී පැවති පදනමේ සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට පදනමට අය විය යුතු සියලු ණය සහ ගෙවිය යුතු සම්මාදම් මුදල් හෝ දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ අරමුදල්.

8. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් මෙතෙක් බාර ගන්නා ලද හෝ මින්මතු භාර ගනු ලබන ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් වූ මුදල් අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි සංස්ථාවේ නමින් එක බැංකුවක හෝ බැංකු කීපයක තැන්පත් කළ හැකි ය.

(2) මෙම පනත යටතේ සංස්ථාවේ බලතල ක්‍රියාත්මක කිරීමේදී සහ ඉටු කිරීමේ දී හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී සංස්ථාව විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

**9.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, කිසියම් ගිවිසුමක් මත හෝ අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතු වන්නාවූ චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට හා දැරීමට නීතියෙහිලා සංස්ථාවට බලය හා හැකියාව ඇති අතර, එම දේපළ සංස්ථාවේ කාර්යය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය. තව ද සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සංස්ථාවට ඇත්තේ ය.

සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.

**10.** සංස්ථාවේ කිසිම සාමාජිකයකු සංස්ථාවේ ණය සහ බැරකම් ගෙවා සමථයට පත් කිරීමේ කාර්යය සඳහා ඔහුගෙන් සංස්ථාවට අයවිය යුතු සාමාජික මුදල් ප්‍රමාණය ඉක්මවන යම් දායක මුදලක් ගෙවීමට යටත් නොවන්නේ ය.

විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපළ.

**11.** සංස්ථාව විසුරුවා හැරීමේදී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසුව කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර නොබෙදිය යුතු අතර, ඒවා සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කර ඇත්තා වූ වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුව ම සංස්ථාවේ සාමාජිකයන් විසින් එම ආයතනය හෝ ආයතන තීරණය කරනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය.

**12.** (1) සංස්ථාවට ලැබුණු සහ සංස්ථාව විසින් වැය කරන ලද සියලු මුදල් පිළිබඳව ගිණුම් නිසි අයුරින් තැබීමට සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(3) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද විගණකවරයකු හෝ විගණකවරයන් විසින් සෑම වර්ෂයකදීම යටත් පිරිසෙයින් එක් වරක් ගිණුම් පරීක්ෂා කොට විගණනය කර ගත යුතු ය.

(4) මේ වගන්තියේ “සුදුසුකම් ලත් විගණකවරයා” යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු ව සිටින්නේ ද, එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

සංස්ථාවේ මුද්‍රාව.

**13.** සංස්ථාවේ සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් සාමාජිකයකු ඉදිරිපිටදී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයේ තම නම් ලියා අත්සන් කළයුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**14.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**15.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.